**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**

# පරීක්ෂක වාර්තාව

කුසලතා කැප්ස්ටෝනය - ජනවාරි 2017

## (SS2) තොරතුරු තාක්ෂණ කුසලතා

(Information Technology Skills)

---

කාර්යාලයීය යෙදවුම් මෘදුකාංග කෙරෙහි වඩාත් සැලකිලිමත් වෙමින් කාර්යාල පරිසරය තුළ තොරතුරු තාක්ෂණ කුසලතා යෙදවීම පිළිබඳ අයදුම්කරුවන්ගේ තොරතුරු තාක්ෂණයේ සමස්ථ දැනුම හා කුසලතා මෙම ප්‍රශ්න පත්‍රයෙන් පරීක්ෂාවට ලක්කරන ලදී. සාර්ථක ආකාරයෙන් මෙම ප්‍රශ්න පත්‍රයට උත්තර දීම සඳහා, කාර්යාලයීය පරිසරයක් තුළ තොරතුරු තාක්ෂණ යෙදවුම් භාවිත පිළිබඳ ප්‍රායෝගික දැනුම අත්‍යවශ්‍ය බව සටහන් කළ යුතුය.

### A කොටස

අනිවාර්ය ප්‍රශ්න විස්සකි (20)

(මුළු ලකුණු 40)

### ප්‍රශ්න අංක 01

සම්පූර්ණ තොරතුරු තාක්ෂණ කුසලතා විෂය නිර්දේශය සාරාංශගත ආකාරයෙන් පරීක්ෂාවට ලක්කර ඇත. අයදුම්කරුවන් සියලු දෙනාම පාහේ උත්තර ලියා තිබූ අතර කාර්යසාධනය සතුටුදායක විය. ඔවුන්ගෙන් වැඩි දෙනෙක් A කොටස සඳහා වෙන්කළ ලකුණු වලින් අඩක් ඉක්මවා ලබාගෙන තිබුණි. සමහරු අංක 1.1 සිට 1.20 දක්වා ප්‍රශ්න අංක නිවැරදිව අංකනය කර නොතිබූ අතර, අතරමැද ප්‍රශ්නවලට උත්තර ලියා නොතිබුණි. උත්තර පත්‍ර කිපයක 1.1 සිට 1.10 දක්වා ප්‍රශ්න සඳහා තෝරාගත් උත්තර අංක වෙනුවට සම්පූර්ණ උත්තර ලියා තිබෙනු දක්නා ලදී. ඵලදායී කාල කළමනාකරණය සහ ප්‍රශ්න රටාව වටහා ගැනීම සඳහා ආදර්ශ ප්‍රශ්න / පසුගිය ප්‍රශ්නවලට උත්තර ලියා පුරුදු පුහුණු වීම යෝග්‍යය. මෙම ප්‍රශ්නයට වැඩි ලකුණු ලබාගත් අයදුම්කරුවන් සමස්ථ වශයෙන් මුළු ප්‍රශ්න පත්‍රයටම ඉහළ ලකුණු ලබා ගත්තවුන් බවද නිරීක්ෂණය විය.

සමස්ථ වශයෙන් මෙම ප්‍රශ්නයට උත්තර ලිවීමේ කාර්යසාධනය සතුටුදායකය.

### <u>B කොටස</u>

අනිවාර්ය ප්‍රශ්න හතර (04) කි.

(මුළු ලකුණු 60)

### ප්‍රශ්න අංක 02

දත්ත පදනමක් නිර්මාණය කිරීම පිළිබඳ දැනුම පරීක්ෂා කරන ලදී. බොහෝ අයදුම්කරුවන් මෙම ප්‍රශ්නය තෝරාගෙන තිබුණි. ඔවුන් අතුරෙන් බහුතරය (a) සහ (b) කොටස් සඳහා හොඳින් උත්තර ලියා ඇත. බොහෝ දෙනා ප්‍රධාන ක්ෂේත්‍රය නිසි සාධාරණීකරණය සහිතව නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණි. එහෙත් (c) කොටස සඳහා සපයා තිබූ උත්තර සතුටුදායක නැත. (b) කොටසේදී වඩාත් සුදුසු දත්ත වර්ග තෝරා ගැනීමේදී string වෙනුවට "name" , currency වෙනුවට "Rs." හෝ "price" ද සමහර අයදුම්කරුවන් ලියා තිබුණි. ප්‍රශ්නයේ ඉඟියක් දක්වා තිබූ නමුත් බොහෝ අයදුම්කරුවන්ට (c) කොටසට සුදුසු උත්තර ලිවීමට හැකිවී නැත. අයදුම්කරුවන්ට මූලික දැනුම තිබුණත් සම්බන්ධිත දත්ත පදනම් පිළිබඳ වැටහීමක් නොමැත.

ප්‍රශ්නය සඳහා උත්තර ලිවීමේ කාර්යසාධනය සතුටුදායකය.

## ප්‍රශ්න අංක 03

පවර්පොයින්ට් මෘදුකාංග භාවිත කරමින් ඉදිරිපත් කිරීමක් නිර්මාණය කිරීමේ හැකියාව පරීක්ෂා කර ඇත. අයදුම්කරුවන්ගෙන් මධ්‍යස්ථ සංඛ්‍යාවක් මෙම ප්‍රශ්නය තෝරාගෙන තිබේ. ඔවුන් අතුරෙන් ස්වල්ප දෙනෙකු පමණක් නිවැරදිව උත්තර ලියා උපකොටස් වලට සම්පූර්ණ ලකුණු ලබා තිබේ. බොහෝ අවස්ථාවල අංග යොමු (feature references) සහ "මෙනු" දියත් කිරීමට (menu navigation) අදාල උත්තර වැරදිය. මෙහිදී මෙවැනි මූලික පවර්පොයින්ට් ඉදිරිපත් කිරීම් ප්‍රායෝගිකව ප්‍රගුණ කිරීමට අයදුම්කරුවන් වැඩි කාලයක් මිඩංගු කළ යුතුය.

අයදුම්කරුවන් සුළු පිරිසක් පමණක් මෙම ප්‍රශ්නයට ඉහළ ලකුණු ලබා තිබුණි.

## ප්‍රශ්න අංක 04

තෝරාගත් ක්‍රියාකාරකම් වලින් ඉටුකෙරෙන කාර්යයන් විස්තර කෙරමින් මයික්‍රොසොෆ්ට් එක්සෙල් පිළිබඳ දැනුම පරීක්ෂා කිරීමට පිළියෙල කළ ප්‍රශ්නයකි. අයදුම්කරුවන් සුළු පිරිසක් පමණක් මෙය තෝරාගෙන තිබූ බව නිරීක්ෂණය විය. අයදුම්කරුවන් කීප දෙනෙකු (a) සහ (c) කොටස් සඳහා සතුටුදායක ලෙස උත්තර ලියා තිබූ නමුත් ඉතිරි කොටස් සඳහා උත්තර දුර්වල විය. ප්‍රශ්නය දී ඇති රටාව වෙනස් වුවද සාධාරණ ප්‍රශ්නයක් වූ නමුත් කාර්යසාධනය අපේක්ෂිත මට්ටමට නොවීය. ප්‍රමාණවත් පුහුණුවීමක් නොතිබූ බව පැහැදිලිව පෙනෙන්නට තිබූ අතර, මයික්‍රොසොෆ්ට් එක්සෙල් ක්‍රියාකාරකම් වලින් ඉටුකෙරෙන කාර්යයන් පිළිබඳව මනා දැනීමක් අයදුම්කරුවන් විසින් ලබාගත යුතුය.

අයදුම්කරුවන් අතලොස්සක් පමණක් මෙම ප්‍රශ්නයට ඉහළ ලකුණු ලබාගෙන තිබුණි.

## ප්‍රශ්න අංක 05

කුඩා ව්‍යාපාරයක් සාර්ථක ලෙස පවත්වාගෙන යාම සඳහා අන්තර්ජාලය සහ ආශ්‍රිත තාක්ෂණය ව්‍යාපාර මෙවලමක් ලෙස භාවිත කිරීම පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම සිදුකර ඇත. විකල්ප ප්‍රශ්න අතුරෙන් වඩාත්ම තෝරාගෙන තිබූ ප්‍රශ්නය මෙය විය.

(a) කොටස සඳහා උත්තර ලිවීමේ කාර්යසාධනය ඉතාමත් සාර්ථකය. එහෙත්, අයදුම්කරුවන් කීපදෙනෙකු හට අන්තර්ජාලයෙන් සැපයෙන සේවා ලැයිස්තුගත කිරීම අපහසු වී ඇත.

අයදුම්කරුවන්ගෙන් බහුතරය මෙම ප්‍රශ්නය සඳහා ඉහළ ලකුණු ලබාගෙන තිබුණි.

## ප්‍රශ්න අංක 06

විද්‍යුත් තැපැල් සේවාදායකයෙකුගේ මූලික වෙනස්කිරීම්, ඒ සඳහා යොදන නියමාවලි (protocols) පිළිබඳ දැනුම සහ විද්‍යුත් තැපැල් යැවීම සඳහා ඇති විකල්ප පිළිබඳව මෙයින් පරීක්ෂා කරන ලදී. අයදුම්කරුවන්ගෙන් බහුතරය මෙම ප්‍රශ්නය තෝරාගෙන තිබුණි. (c) සහ (d) කොටස් සඳහා උත්තර සාර්ථකය. එසේවුවත්, විද්‍යුත් තැපැල් පිළිබඳ තාක්ෂණික නිර්මාණය (architecture) මත පදනම් වූ (a) සහ (b) කොටස් සම්බන්ධයෙන් නියම උත්තර සැපයීමට සමහර අයදුම්කරුවන්ට හැකිවූයේ නැත.

මෙම ප්‍රශ්නය සඳහා උත්තර ලිවීමේ කාර්යසාධනය මධ්‍යස්ථය.

## ප්‍රශ්න අංක 07

තෝරාගත් අංග වලින් ඉටුකෙරෙන කාර්යයන් පැහැදිලි කරමින් කෙටි සටහන් ලිවීම තුලින් මයික්‍රොසොෆ්ට් වර්ඩ් (Microsoft word) පිළිබඳ පරිණතභාවය පරික්ෂා කිරීමට යොදා තිබූ ප්‍රශ්නයකි. අයදුම්කරුවන්ගෙන් බහුතරය ප්‍රශ්නයට උත්තර ලියා තිබුණි. ඔවුන්ගෙන් සියලුදෙනාම වාගේ (b) (i) කොටසට නිවැරදිව උත්තර ලියා තිබුණේය. එහෙත් ඉතිරි කොටස්වලට නිවැරදි උත්තර ලියා තිබුණේ කිහිප දෙනෙකු පමණකි. අයදුම්කරුවන්ගෙන් සැහෙන ගණනක් Footnote යන්න Footer සමගද, Hyphenation යන්න Hyperlink සමගද පටලවාගෙන තිබුණි.

අයදුම්කරුවන් ස්පල්ප දෙනෙකු පමණක් මෙම ප්‍රශ්නය සඳහා ඉහළ ලකුණු ලබාගෙන තිබුණි.

\- - -

**<u>විභාග අයදුම්කරුවන්ගේ කාර්යසාධන මට්ටම දියුණු කර ගැනීමට සැළකිල්ල යොමු කළ යුතු පොදු කරුණු:</u>**

1. විෂය නිර්දේශය පූර්ණ වශයෙන් හොඳින් අධ්‍යයනය කර තිබීම හා විෂය කරුණු පිළිබඳ වැඩි අවධානය යොමු කිරීම.
2. ප්‍රශ්නය කිහිපවරක් කියවා බලා නිශ්චිත ඍජු පිළිතුරු සැපයීම කළ යුතු අවස්ථාවලදී අනවශ්‍ය පැහැදිලි කිරීම් / විස්තර ලිවීම් නොකළ යුතුය.
3. මෙම විෂයට අදාල ග්‍රන්ථ, අත්පොත්, ලිපි, සඟරා, ආදිය මැනැවින් පරිශීලනය කිරීම.
4. අත් අකුරු කියවිය හැකි ආකාරයටත් ප්‍රශ්න අංක නිවැරදිව නිසි පරිදි යෙදීමටත් කටයුතු කළ යුතුය.
5. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් නිවැරදිව පිළිපැදීම.
6. පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර හා උත්තර පරිශීලනය කිරීමෙන් තම දැනුම ප්‍රගුණ කළ හැකිය.
7. කාලය මනාව කළමනාකරණය කර ගැනීම.
8. උත්තර පත්‍ර බාරදීමට පෙර ප්‍රශ්න අංක / විභාග අංකය ආදිය නිසිපරිදි යොදා තිබේදැයි නැවත පරික්ෂා කර බැලීම.
9. පෙර සූදානමක් සහිතව විභාගය සමත්වීමේ පරම චේතනාවෙන් ඉදිරිපත් වීම.

\- * * * -